# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 155/11 — 1975 මාර්තු 19 වැනි බදාදා — 1975.03.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (49)/75.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වන අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතෙහි 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝගය.

**වි. ගොපල්ලව,**
ජනාධිපතිවරයා.

1975 මාර්තු 19 වන දින,
කොළඹ දී ය.

**නියෝගය**

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් කවර බන්ධනාගාරයක වුවද අධිකාරී වෙත ලිඛිත ආඥාවක් යැවීමෙන්—

(i) ඒ බන්ධනාගාරයෙහි සිරකර සිටින එම ආඥාවෙහි නිශ්චිතව සඳහන් සියලුම වර්ගවල හෝ වර්ග කිසිවක සිරකරුවන් ; හෝ

(ii) ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් වූත් යම් හදිසි අවස්ථා නියෝගයක් හෝ හදිසි අවස්ථා නියෝග යටතේ ඒ බන්ධනාගාරයෙහි නීත්‍යානුකූල සිරභාරයෙහි තබාගෙන සිටින්නා වූත් සියලුම වර්ගවල හෝ වර්ග කිසිවක තැනැත්තන්

සම්බන්ධයෙන්,

(අ) බන්ධනාගාර ආඥාපනතේ සියලුම විධිවිධාන හෝ විධිවිධාන කිසිවක් ; හෝ

(ආ) එම ආඥාපනත යටතේ පනවන ලද සියලුම රීති හෝ රීති කිසිවක්

අදාළ නොවිය යුතු යයි හෝ එම ආඥාවෙහි දක්වනු ලැබිය හැකි වෙනස් කිරීම්වලට යටත්ව අදාළ විය යුතු යයි නියම කළ හැකිය.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

31A——ජ 12869—2,100 (75/03)